# මෝටර් රථ තාක්ෂණික උපදේශකවරයෙකු තාවකාලික පදනම මත බඳවාගැනීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ සහ දිවයින පුරා විසිරී පවත්නා ගොවිපල වල වාහන හා යන්ත්‍රසූත්‍ර වල කල යුතු අලුත්වැඩියාවන් පරීක්ෂා කර බලා වාර්ථාවන් නිකුත්කිරීම සඳහා පහත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රට අදාල ඉංජේනේරු උපාධිය හා එම අධ්‍යාපන සුදුකම් ලැබීමෙන් පසු රජයේ/ රජයේ ආයතනයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක වර්ෂ 05කට නොඅඩු පළපුරුදද්ක් ලබා තිබීම.

හෝ

ඉහත ක්ෂේත්‍රයට අදාල තෘතීය හා වෘතීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ යාන්ත්‍රික පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තීබීම හා එම අධ්‍යාපන සුදුකම් ලැබීමෙන් පසු රජයේ/ රජයේ ආයතනයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක වර්ෂ 10කට නොඅඩු පළපුරුදද්ක් ලබා තිබීම.

හෝ

ඉහත ක්ෂේත්‍රයට අදාල තෘතීය හා වෘතීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ යාන්ත්‍රික පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවෙනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තීබීම හා එම අධ්‍යාපන සුදුකම් ලැබීමෙන් පසු රජයේ/ රජයේ ආයතනයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක වර්ෂ 15කට නොඅඩු පළපුරුදද්ක් ලබා තිබීම.

හෝ

ඉහත ක්ෂේත්‍රයට අදාල තෘතීය හා වෘතීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ යාන්ත්‍රික පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තීබීම හා එම අධ්‍යාපන සුදුකම් ලැබීමෙන් පසු රජයේ/ රජයේ ආයතනයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක වර්ෂ 20 නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම

**සේවා කොන්දේසි**

1 මෙම තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවාගැනීම සිදුකෙරේ.

**රාජකාරි විස්තරය**

1. මණ්ඩලයේ ඇති වාහනවල සහ යන්ත්‍රෝපකරණවල පවතින කාර්මික දෝෂයක් සහ නඩත්තු කටයුතු පිළිබඳව පරීක්ෂා කර බලා වාර්ථාකිරීම.
2. කාර්මික දොෂයන්ට ලක්ව ඇති යන්ත්‍රෝපකරණ පරීක්ෂා කර බලා ඒවායේ කලයුතු අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් වාර්ථාකිරීම.
3. අලුත්වැඩියා කටයුතු සඳහා ගරාජ්වලට යොමු කොට ඇති වාහන වල අලුතුවැඩියා කටයුතු සාර්ථකව නිමකර ඇත්ද යන්න පරීක්ෂා කර බලා වාර්ථා කිරීමත් අලුත්වැඩියා සම්බන්ධයෙන් වන මිල කැඳවීම් සහ බිල්පත් පරීක්ෂා කර බලා නිර්දේශ නිකුත්කිරීමත් සිදුකලයුතුය.
4. වාහන අලුත්වැඩියාවන් සඳහා මිලගණන් කැඳවීම කරන අවස්ථාවලදී ඒවාට අදාල පිරිවිතරයන් සකස් කිරීම.
5. වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා වූ තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා සහභාගිවී නිර්දේශ ලබාදීම.

**වැටුප**

පැමිණෙන එක් දෛනික කැඳවීමක් වෙනුවෙන් රු: 3000.00 දීමනාවක් සහ ප්‍රධාන කාර්යාලයෙන් බාහැර රාජකාරි කටයුතු සඳහා ගමන් වියදම්, යැපීම් දීමනා ද ගෙවනු ලැබේ.

අයදුම්පත් තමා විසින්ම සකස් කොට සියලු තොරතුරු හා සුදුසුකම් ඇතුලත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අදාල අයදුම්පත් 2020.09.04 වන දිනට පෙර ලියාපදිංචි තැපැල් මගින් හෝ ඊ-මේල් මගින් පහත ලිපිනයන්ට ලැබීමට සලස්වන්න.

**සභාපතිතුමා,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,**
**නො: 40,**
**නාවලපාර,**
**නාරාහේන්පිට,**
**කොළඹ 05.**
**email – nldbch@gmail.com**